පරිසර සම්පත් පැතිකඩ
2025

590 - මාගම්මන නැගෙනහිර

1. හැඳින්වීම

I. මූලික තොරතුරු

a) වසම හා අංකය - මාගම්මන නැගෙනහිර 590

b) වපසරිය

වර්ග කිලෝමීටර්	අක්කර	හෙක්ටයාර්
1.65	407.724	165

c) ප්‍රා ලේ කොට්ඨාසය	හෝමාගම
d) ගොවිජන හා කෘ.ප.නි.ස කොට්ඨාසය	කහතුඩුව/මාගම්මන
e) සෞ.වෛ.නි. කොට්ඨාසය	කහතුඩුව
f) පශු වෛද්‍ය නිලධාරි කා.කොට්ඨාසය	හෝමාගම
g) බීට්ටු වන නිලධාරි කාර්යාල කොට්ඨාසය	කළුතර
h) අඩවි වන නිලධාරි කාර්යාල කොට්ඨාසය	වග
වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසය	කොළඹ

II. ජනගහණය

ස්ත්‍රී	පුරුෂ	මුළු ජනගහණය
2643	2620	5263

මූලාශ්‍රය :ජන හා නිවාස සංගණනය 2024

III. ජනාවාසකරණයේ ස්වභාවය - අර්ධ නාගරික/ග්‍රාමීය

IV. දේශගුණික තොරතුරු

a) අක්ෂාංශ හා දේශාංශගත පිහිටීම — උතුරු අක්ෂාංශ - 6.912

නැගෙනහිර දේශාංශ - 79.9687

b) උෂ්ණත්වය (සාමාන්‍ය/උපරිම/අවම



	ජන:	පෙබ:	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ	සැප්:	ඔක්:	නොවැ	දෙසැ:
වර්ෂාව (mm)	50	40	150	200	220	300	350	320	270	150	200	100
උෂ්ණත්වය-	23 32	24 33	23 31	24 30	23 30	24 29	23 28	23 30	24 29	23 30	24 30	24 30

c) වර්ෂාපතනය (mm)



d) සාපේක්ෂ ආර්ද්‍රතාව 36% පමණ

v. පාංශු තොරතුරු

a) පසේ ස්වභාවය — බොරලු මිශ්‍ර පසකි

b) පසේ වර්ගය — රතු කහ පොඩ්සොලික්

c) සුලබ පාෂාණ ස්ථිත්වය (ග්‍රැනයිට්/ග්‍රැෆයිට්/ෆෙල්ස්පාර් ආදිය) — ග්‍රැනයිට්

පරිසර සම්පත් පැතිකඩක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාව

I. සම්පත් පිළිබඳ සමාලෝචනය කිරීම
II. තිරසර සම්පත් භාවිතාව හා කළමනාකරණය කිරීම
III. පාරිසරක ගැටළු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම
IV. පරිසර කළමනාකරණයෙහිලා ප්‍රජාවේ දායකත්වය,සහභාගීත්වය හා අවබෝධය පුළුල් කිරීම
V. සංවර්ධන යෝජනා හඳුනාගැනීම හා පරිසර ශක්‍යතා සමගාමී කිරීම
VI. ආපදා අවදානම් හඳුනාගැනීම හා බලපෑම් අවම කරගැනීම
VII. අඛණ්ඩ මෙහෙයුම්කරණය,අධීක්ෂණය හා අගැයීම ස්ථාපිත කිරීම

3.ස්වභාවික සම්පත් පැතිකඩ

I.භෞමික සම්පත්

a) වපසරිය/භූමි ප්‍රමාණය

වර්ග කිලෝමීටර්	අක්කර	හෙක්ටයාර්
1.65	407.724	165

b) භූමි පරිහරණ සැලසුම

- කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි පරිහරණය

අනු අංකය	භූමි පරිභෝජනය	භූමි ප්‍රමාණය (අක්කර)
1	ප්‍රධාන වැවිලි – (පොල්)	4.046
2	සුළු අපනයන බෝග – (කුරුඳු,ගම්මිරිස්,කහ,ඉගුරු වැනි)	2.428
3	වී වගාව - වගා කරන පුරන් කුඹුරු	 25.628 4.977
4	වෙනත් කාලීන බෝග වගාව (1,2 සඳහා අයත් නොවන) (රබර්)	4.856
5	ගෙවතු වගාව	1.26464
6	මිශ්‍ර භෝග	-
7	ජලයෙන් යටවූ බිම් (වැව්, ජලාශ, වාරි මාර්ග, ගංගා)	නැත
8	රජයේ ඉඩම් දැනට භාවිත කරන දැනට භාවිත නොකරන නොකරන නමුත් වගා කිරීමට සුදුසු	 නැත
9	ගල්/ වගුරු සහිත හා මුඩු බිම්	නැත

i. වී - වගා කරන

අක්කර	රූඩ්	පර්චස්	කැබලි
63	00	33.82	137

ii. වෙනත් ධාන්‍ය බෝග (ඉරිඟු/මුං/කවුපි ආදිය)- වාර්තා වී නැත

iii. අපනයන කෘෂි බෝග (ඇමුණුම 01)

බෝග වර්ගය	ප්‍රමාණය (අක්කර)
කුරුඳු	1
ගම්මිරිස්	3
කෝපි 1.	0.25
බුලත් 2.	1
ඉඟුරු 3. 4.	0.3
කහ 5.	0.25
ගොරකා 6.	0.0025
පුවක් 7.	0.25
කරදමුංගු/කරාබු/වැනිලා/ලෙමන්ග්‍රාස්/පැඟිරි/සාදික්කා 8.	නැත

iv. භූමි යෙදවුම

1. ගොඩ ඉඩම්
2. මඩ ඉඩම් (ශ්‍රේණිය සහිතව)
3. පුරන් වූ /අත්හැර දැමූ

මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය

A	R	P	කැබලි
76	00	28.79	159

වැඩ කරන කුඹුරු(W) පුරන් කුඹුරු(N,W)

A	R	P	කැබලි	A	R	P	කැබලි
63	00	33.82	137	12	03	34.97	22

A කාණ්ඩය B කාණ්ඩය C කාණ්ඩය

A	R	P	කැබලි	A	R	P	කැබලි	A	R	P	කැබලි
01	01	00	02	10	02	14.97	18	01	00	20	02

A - කාණ්ඩය වගා කල හැකි

B - කාණ්ඩයවගා කිරීමට නොහැකි-

C- කාණ්ඩයගොඩ ඉදිකිරීම් -



c) පසේ ස්වභාවය හා සාඵලාතාව වැලි සහ බොරළු ලෝම පස

d) පාංශු ඛාදනයේ ස්වභාවය වාර්තා වී නොමැත

e) පාංශු හායනයේ ස්වභාවය

මිනිසුන්ගේ විවිධ ක්‍රියාකාරකම් මත පාංශු හායනය සුළු වශයෙන් වාර්තා වේ.

II. ජලජ සම්පත්

a) මතුපිට ජල මූලාශ්‍ර

- ගංගා - නොමැත
- අතු ගංගා /ඔය/දොළ -නොමැත
- ඇල මාර්ග -

ඇල මාර්ග	ඊරියගහ කුඹුර වම් ඇල 175 M දකුණු ඇල 460 M ගලගාව කුඹුර වම් ඇල 120 M දකුණු ඇල 65 M මැද ඇල 240 M වෙදගෙවිල කුඹුර වම් ඇල 280M දකුණු ඇල 270M අළුබෝ ගහ කුඹුර වම්ඇල 200M දකුණු ඇල 70M ආරාමය පාර වම්ඇල 525M දකුණු ඇල 160M බටපොත වම් ඇල 300M දකුණු ඇල 120M වේවැල් තලාව දකුණුඇල 310M ගල්දොල යාය වම්ඇල 250M දකුණුඇල 660M දළුග්ගල දෙනිය වම් ඇල 460M දකුණු ඇල 200M මැද ඇල 100M බුලත්කනත්ත දෙනිය වම 800M දකුණු ඇල 500M

- 590 මාගම්මන නැගෙනහිර කෘෂිකර්මම පර්යේෂණ හා නිෂ්පාදන නිලධාරිතුමාගේ හා මාගම්මන පුබුදු ගොවි සංවිධානයෙන් ඉහත කෘෂිකර්මාන්තයට අදාල තොරතුරු ලබා ගන්නා ලදී.
  - වැව් /තටාක නොමැත
  - පොකුණු/ නිර්මිත පොකුණු (අත්හළ ගල්වල) 01

b) දිය උල්පත් - නොමැත

c) භූගත ජලය

- ළිං
- නළ ළිං

පුද්ගලික ළිං	නළ ළිං	පොදු ළිං
525	01	05

d) වර්ෂාපතනය

- වාර්ෂික මධ්‍යනය වර්ෂාපතනය (mm) - 280mm

- වර්ෂා ක්‍රමය (මෝසම්/සංවහන)

වර්ෂා ක්‍රමය	වැසි ලැබෙන කාල සීමාව
පළමුවන අන්තර් මෝසම් වැසි	මාර්තු /අප්‍රේල්
නිරිතදිග මෝසම් වැසි	මැයි / සැප්තැම්බර්
දෙවන අන්තර් මෝසම් වැසි	ඔක්තොම්බර් / නොවැම්බර්

e)වාරිමාර්ග කටයුතු

- මහා වාරි ව්‍යාපාර -අදාල නොවේ
- සුළු වාරි ව්‍යාපාර - අදාල නොවේ

f) ජලයේ ගුණාත්මකබව -PH.6.5-7.5

f) ජල සුලබතාව - ජල හිඟයක් පිළිබඳව වාර්තා නොවේ

-

ප්‍රධාන මූලාශ්‍රය - Main Source	නිවාස සංඛ්‍යාව	පවුල් සංඛ්‍යාව	රජයේ කාර්යාල -	ව්‍යාපාරික ස්ථාන	කර්මාන්ත	පාසැල්	ආගමික ස්ථාන
තමාගේම ආරක්ෂිත ළිඳක් මගින් ජලය සපයා ගන්නා - Protected Well in Own House	609	625	-	-	-	-	-
තමාගේම නළ ළිඳක් මගින් ජලය සපයා ගන්නා	-	-	-	--	-	-	1
ජල සම්පාදන මණ්ඩලය මගින් ජලය සපයා ගන්නා -	1110	1123	-	128	5	-	1
ප්‍රජා ජල ව්‍යාපෘති මගින් ජලය සපයා ගන්නා	332	345	-	12	-	-	1

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ 2024

III. වනාන්තර හා වනවගාවන්

a) වන වැස්මේ ව්‍යාප්තිය - අදාළ නොවේ

b) සුලබ ශාක පිළිබඳ ලේඛනය

ශාක වර්ගය	ප්‍රමාණය
කොස්	950
දෙල්	100
අඹ	626
රඹුටන්	325
වෙරළු	250
පේර	422
පොල්	1500
කෙසෙල්	1350
නාරන්	250
බෙලි	65

මූලාශ්‍රය : Food Gate සමීක්ෂණය 2022/23

c) දැවමය නොවන වන නිෂ්පාදන (NTFPs)

- ආහාර හා ආකලන

- දේශීය ඖෂධ
- ශාකසාර (රෙසින්/තෙල්/ලාටු/මැලියම් ආදිය)
- අත්කම් අමුද්‍රව්‍ය (වේවැල්/හණ/පට්ට ආදිය)
- ඉදිකිරීම් අමුද්‍රව්‍ය
- සැරසිලි හා සංස්කෘතික වටිනාකම් සහිත ද්‍රව්‍ය

ආහාර හා ආකලන	මැ,පතෝල,බණ්ඩක්කා,මිරිස්,කීර වර්ග,ඉගුරු,කහ,කරපිංචා,නිවිති,කතුරුමුරුංගා,මඤ්ඤොක්කා,බතල,හිගුරල
දේශීය ඖෂධ	කෝමාරිකා,හාතාවාරිය,ඉරමුසු,පාවට්ටා,ලුණු විල,වෙනිවැල්,දිය බෙරලිය, ගොටුකොළ,කොහොඹ,බැබිල,පිටවක්කා
ශාක සාර	රබර්
අත්කම් අමුද්‍රව්‍ය	උණ,පොල්,ක්‍රෝටන් වර්ග,විසිතුරු පත්‍ර
ඉදිකිරීම් අමුද්‍රව්‍ය	උණ,පොල්,කොස්,තේක්ක,මුරුත,රබර්
සැරසිලි හා සංස්කෘතික වටිනාකම් සහිත	උණ,පොල්,ක්‍රෝටන් වර්ග,විසිතුරු පත්‍ර

d) වන විනාශකිරීම් පිළිබඳ විස්තරය - වාර්තා නොවේ

e) වනවගා ව්‍යාපෘති විස්තරය - වාර්තා නොවේ.

f) වන සංරක්ෂණ ප්‍රයත්නයන්

- ප්‍රජා වැඩසටහන් - විස්තර නොමැත
- රාජ්‍ය/රාජ්‍ය නොවන/ ස්වේච්ඡා සංවිධාන මඟින් - විස්තර නොමැත

IV. ජෛව විවිධත්වය

a) ශාක ලේඛනය

b) ශාක වර්ගීකරණය (දේශීය/ඒකදේශීය/හඳුන්වාදුන් විදේශීය හෝ දේශීය/ස්වභාවීකෘත විදේශීය හෝ දේශීය/ආගන්තුක/ආගන්තුක-ආක්‍රමණශීලී වශයෙන්) (ප්‍රස්තාර සහිතව)

දේශීය ශාක	ඒක දේශීය	හඳුන්වාදෙන දේශීය/විදේශීය	ස්වභාවිකෘත දේශීය/විදේශීය	ආගන්තුක ශාක	ආගන්තුක ආක්‍රමණශීලී
කොහොඹ	හීං බෝවිටියා	ඇකේෂියා	නැත	ගදපාන	නැත
බුරුත	ගොඩපර	කහ කරද		යකඩ මරන්	
කදුරු	කුරුඳු	ක්‍රිස්ටිනා			
කොස්	ගොරකා	රට පුවක්			
ගිරිතිල්ල	රුක් අත්තන				
මුරුංගා	කිරි ඉද්ද				
හල්	දිය හබරල				
වෙරළු	ඇටඹ				
වල් කදුරු	හොර				
	වල් දෙල්				
	දෝතලු				

c) අන්තරායට ලක්වූ කාණ්ඩ (CR/EN/VU-IUCN) (ප්‍රස්තාර සහිතව) නොමැත

4.පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම්

1. කෘෂිකර්මය

a) ප්‍රධාන භෝග (වී)

වර්තමානයේ අක්කර 63 පර්චස් 33.82 ක කුඹුරු ගොවිතැනේ යෙදෙන අතර ඉඩම් කැබලි 137 ක් ඊට අදාල වේ. වී ගොවිතැන පෙර පැවති සාම්ප්‍රදායක බවින් මිදී නවීන අත්හදා බැලීම් රසායනික පොහොර භාවිතයේ ඉහළ යාමක් කැපී පෙනෙන්නට ඇත.ස්වභාවධර්මයා හා ඉතා සමීප සබදතාවයක් පවත්වන ලද කෘෂිකර්මාන්තය පරිසරය හා ඇත්තේ අත්‍යන්ත වූ බැඳීමකි.මෙකී බැදීම මිනිසාගේ විවිධ අනිසි ක්‍රියාකාරකම් නිසාවෙන් විෂම වී ඇත.

විශේෂයෙන්ම මාගම්මන වූ කලී නාගරීකරණය වෙමින් පවතින ගම්මානයකි.ජනගහණයේ සීඝ්‍ර වැඩි වීම හා ගම් වලින් වැඩි වශයෙන් මෙම ප්‍රදේශයට ජනතාව සංක්‍රමණය වීම හේතුවෙන් ජනගහණය ඉහල යාම ඊට සාපේක්ෂව සම්පත් පරිභෝජනය වැඩි වීම, ඉඩම් ගොඩ කිරීම,ඔිවිටවල නිවෙස් ඉදි කිරීම පවා මෙම ප්‍රදේශයේ දැකිය හැකි සුවිශේෂි ලක්ෂණයකි.එසේම මිනිසුන් විවිධ රැකියා වල නිරත වීම,විදේශ ගත වීම වී ගොවිතැනෙන් ගොවියන් ඈත් වීමට හේතු වී ඇත.

පාරසරික තිරසාරත්වය කරා යන ගමනේ එහි අභිමතාර්ථ මුදුන් පමුණුවා ගැනීමට නම් අභාවයට යන වැඩි අස්වැන්නක් ලබා දෙන දේශීය වී ප්‍රභේද ගොවීන්ට හඳුන්වා දීම,රජයේ මැදිහත් වීමෙන් අදාල නෛතික පසුබිම සැකසීම, පරිසර හිතකාමී ක්‍රමවේදයන් හඳුන්වාදීම ඒ තුලින් මිනිසුන්ගේ ඉහල ආර්ථික තත්වයක් ඇති කිරීම සිදු කළ යුතුය.

b) අතිරේක භෝග (ධාන්‍ය හා ආහාර බෝග වර්ග)

අතිරේක භෝග වගාව ලෙස මෙම ප්‍රදේශයේ ධාන්‍ය වර්ග වගා නොකලද පහතරට එළවළු භෝග පලතුරු, කීර වර්ග අල වර්ග වගා කෙරේ. අක්කර 13 ක අතිරේක භෝග වගාවේ යෙදේ. මිරිස් වර්ග,මෑ, දඹල, බටු, බණ්ඩක්කා, පතෝල, වැටකොළු ආදී එළවළු ද සුළු වශයෙන් ගස්ලබු අන්නාසි වැනි පලතුරු ද හිගුරල මඤ්ඤොක්කා වැනි අල වර්ග ද කංකුන්, මුගුණුවැන්න, නීරමුල්ලිය, ගොටුකොළ වැනි කීර වර්ග ද වගා කෙරේ.

ඉහත සදහන් කල පරිදි ජනගහනය වැඩි වීමත් සමග ඉඩම් කට්ටිවීම සම්පත් පරිභෝජනයේ ඉහළ යාම මිනිසුන් කාර්යබහුල වීම රසායනික පොහොර භාවිතය අධික වීම ආදී මිනිසාගේ විවිධ බලපෑම් ද මොනරා,ඉත්තෑවා, වදුරා වැනි සතුන්ගෙන් සිදු වන අහිතකර බලපෑම් ද මෙහිදී අස්වැන්න උච්චාවචනය වීම හා වගාවෙන් ඈත් වීමට හේතු වී ඇත.

කාර්යබහුල ජනතාවක් වෙසෙන මෙම අර්ධනාගරීක මාගම්මන ප්‍රදේශයේ පවතින සීමිත ඉඩකඩ ප්‍රයෝජනයට ගනිමින් සිරස් ගොවිතැන අනුගමනය කිරීම උචිත වේ.වර්තමානයේ ගොවියන් අතර රසායනික පොහොර භාවිතයට වැඩි නැඹුරුවක් පවතින අතර එය මිනිසාට මෙන්ම ජෛව පද්ධතියටද ඇති කරනුයේ අහිතකර බලපෑම් පමණක්මය. එහි ප්‍රතිඵලය අනාගතයේ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන තිරසර සංවර්ධනයට බාධාවකි.

ඉන් වර්තමානයේ මෙන්ම අනාගතයේද සෞඛ්‍ය ගැටලු මතු කරයි.එසේම පාරිභෝගිකයා වස විසෙන් තොර එළවළු පලතුරු පලා වර්ග ඉල්ලා සිටින බැවින් කාබනික ගොවිතැන අඛණ්ඩව වර්ධනය කිරීමට කටයුතු කළ යුතුය. කෘත්‍රිම පොහොර පලිබෝධනාශක වලින් වැලකී කොම්පෝස්ට් හා ජීව විද්‍යාත්මක පලිබෝධ පාලනය වැනි ස්වභාවික විකල්පයන් ගොවියන්ට හදුන්වා දෙමින් ඒ සදහා දිරි ගැන්වීම තුලින් අනාගත සුරක්ෂිතතාව ඇති වේ.

මෙම ප්‍රදේශයේ තේ හෝගය නොමැති අතර පොල් සහ රබර් වතු දැකිය හැකිය.අක්කර 10 ක පමණ පොල් වගාවේ ව්‍යාප්තිය දැකිය හැකි අතර මීට වසර 30 පෙර අතීතයේ පොල් ඉඩම් විශාල සංඛ්‍යාවක් මෙම ප්‍රදේශයේ තිබී ඇති බවට සඳහන් වේ. මාගම්මන නැගෙනහිර නිවාස 160 කින් යුත් මුණසිංහගම නිවාස යෝජනා ක්‍රමය බිහි වූ ප්‍රදේශය,අක්කර 15 පමණ විහිදී ඇති නිවාස 142 කින් යුක්ත වූ මවුන්ට් ක්ලිෆර්ඩ් රෙසිඩන්සීස් හා නිවාස 688 කින් යුත් මවුන්ට් ක්ලිෆර්ඩ් රේන්ච් නිවාස සංකීර්ණණය පිහිටා ඇති ප්‍රදේශයේ පොල් තිබී ඇත.

වර්තමානය වන විට මෙම ප්‍රදේශයේ අක්කර 4 ක් පමණ රබර් වගාව දැකිය හැකි නමුදු මීට වසර ගණනාවකට පෙර මෙම ප්‍රදේශය රබර් වතු වලින් ගහනය වූ ප්‍රදේශයක් ලෙස හැඳින්වෙන නමුත් දැනට ඇත්තේ සුළු ප්‍රමාණයකි.ඉන් කිරි කැපීමද කරනුයේ සුළු වශයෙනි.



d) සුළු අපනයන හෝග /අපනයන කෘෂි බෝග (ඇමුණුම 01)

හෝගය	ප්‍රමාණය (අක්කර)
කුරුඳු	2
ගම්මිරිස්	3
කෝපි	1
බුලත්	1
ඉඟුරු	0.5
කහ	0.5
ගොරකා/පැඟිරි/කොකෝවා/සාදික්කා/කරදමුංගු/කරාබු/වැනිලා	නැත

e) වෙනත් වානිජ හෝග (පාම්/අගාවුඩ් ආදිය) - අදාළ නොවේ.

f) රසායනික පොහොර



මූලාශ්‍රය : වසමේ ගොවීන් 25ක් යොදා සිදුකළ සමීක්ෂණයක් ඇසුරිනි

ගොවීන් අතරින් 25 දෙනෙකු තෝරා ගෙන නියදි පරීක්ෂණයක් මගින් රසායනික පොහොර භාවිතය පිළිබඳ දළ අදහසක් ලබා ගන්නා ලදී.

වී ගොවිතැනේ දී මෙන්ම අනෙකුත් භෝග වගාවේ දී ද රසායනික පොහොර කාබනික පොහොර භාවිතය තරම්ම යොදනු ලැබේ.රසායනික පොහොර ලෙස කැට පොහොර,යූරියා,බණ්ඩි පොහොර ආදිය මෙම ප්‍රදේශයේ බහුලව භාවිතා කරනු ලැබේ.රසායනික ද්‍රව්‍ය භාවිතය ඉහල යාමත් සමග පස දූෂණය වීම,පාංශු ජීවීන්ට හානි වීම ,ශාක ප්‍රජාවට හානි වීම එමගින් භූගත ජලය දූෂණය වීම වැනි කරුණු රැසක් ඉස්මතු වෙමින් පවතී.

විශේෂයෙන්ම කුඹුරු ආශ්‍රිතව ඇල මාර්ග වල ජීවත් වූ දණ්ඩි පැටවු ,ආදා ,පෙතියා,මගුරා මත්ස්‍යයින් වර්තමානයේ දැකීමට නොහැකි තරම් ය.මෙම තත්වය රසායනික පොහොර භාවිතයේ අහිසි ප්‍රතිඵලයක් ලෙස හැදින්විය හැකිය.

g) කෘමි/පළිබෝධනාශක යෙදවුම

වගාවන්ට කෘමින්ගෙන් දිලීර වලින් බැක්ටීරියා හා වෛරස් රෝග වැළදීමේ අවදානම වැඩිය. මෙම හානි දායක තත්වයන්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීමට අධික වෙහෙසක් දැරිය යුතුය.එබැවින් බොහෝ ගොවීන් පුරුදු වී සිටින්නේ පලිබෝධනාශක භාවිතා කිරීමටයි. ඒ අතර ජෛව රසායන දේශීය පලිබෝධනාශක ද භාවිතා කෙරේ.



h) සම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත්

සාම්ප්‍රදායික ගොවිතැන් ක්‍රම වර්තමානයේ දුරස් වී ඇති අතර සාම්ප්‍රදායික අද ගොවිතැන ඇතැම් ගොවියන් අතර පවතී.දැකැති භාවිතයෙන් අනන්‍යොන්‍ය සුහදත්වයෙන් අස්වනු නෙලීම ද සුළු වශයෙන් දැකිය හැකිය. ස්වභාවික පොහොර භාවිතා කරනුයේ සුළු පිරිසකි.මෙම ප්‍රදේශයේ ගොවියන් දෙදෙසනකු විසින් රත් දැල,සුවදැල්,මඩතවාලු වැනි දේශිය බිත්තර වී වගා කරනු ලැබේ.

i) නවීන කෘෂිකාර්මික පිළිවෙත්

බිම් සකස් කිරීමේ පටන් අස්වනු නෙළීම දක්වා යන්ත්‍ර උපකරණ භාවිතය වැඩිවශයෙන් දැකිය හැකිය.ස්වභාවික පොහොර අභිබවා රසායනික පොහොර භාවිතය කැපී පෙනෙන ලක්ෂණයකි. හරිතාගාර කෘෂිකර්මාන්තය සුළු වශයෙන් යෙදේ. ගෙවතු වගාවේ නව ප්‍රවණතාවයක් ලෙස සිරස් ගොවිතැන භාවිතා කිරීම දැකිය හැකිය.

j) යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP)- *මෙම ප්‍රදේශයේ මෙම සහතිකය ලබා නැත.*

k) කෘෂිකර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා (ස්වභාවික ආපදා/කෘමි හා පළිබෝධ බලපෑම්)

මෙම ප්‍රදේශයේ ස්වභාවික ආපදා නොමැති නමුත් වර්තමානයේ ගොවියාට කෘෂිකර්මාන්තය යනු වචනයේ පරිසමාප්තියෙන්ම අභියෝගයකි.විශේෂයෙන්ම වර්තමානයේ උෂ්ණත්වය ඉහල යාම මත රෝග හා පළිබෝධ ව්‍යාප්තිය වැඩි වශයෙන් දැකිය හැකිය.

බෝග වල ආයු කාලය කෙටි වීම හා බෝග අස්වැන්න ප්‍රමාණාත්මකව හා ගුණාත්මක බවින් අඩු වීම ගොවියා මුහුණ දෙන අභියෝගයන්ය.ඒ අතර පාරිභෝගිකයින් වස විසෙන් තොර ආහාර සඳහා වැඩි රුචිකත්වයක් දක්වන බැවින් අලවියේද ගැටලු පවතී.

වගාවට සෘජුව මෙන්ම වක්‍රාකාරව බලපාන ජීවී පරාග කාරකයන් හිග වීම ඔවුන්ගේ වාසස්ථාන විනාශ වීම ,කෘමි සතුන්ට අවශ්‍ය ආහාර හිග වීම ,ඒක බෝග වගාවන්ට ගොවියන් වැඩි වශයෙන් යොමු වීම අධික ජනගනත්වය හමුවේ නාගරීකරණය එතුලින් පාරසරික සමතුලිතතාවය බිඳී යාම ආදි කරුණු නිසා කෘෂි පළිබෝධක වැඩි වශයෙන් භාවිතා කිරීමට හේතු වී ඇත.

II.පශු සම්පත් කර්මාන්ත

a) සුලබ පශු කර්මාන්ත යෙදවුම් (ගව/මීගව/එළු/කුකුළු/වෙනත්)

සත්ව වර්ගය	සතුන් සංඛ්‍යාව	ඇතිකරනුයේ කුමකටද යන වග	වර්ගය		ගොවීන් ගණන
ගවයන්	6	කිරි ලබා ගැනීමට	සහිවාල්	අඩ නිදැලි ක්‍රමය	03
මී ගවයන්	5	මී කිරි සෑදීම	දේශීය මී ගව	අඩ නිදැලි ක්‍රමය	01
කුකුළන්	70	බිත්තර ලබා ගැනීම සඳහා		අඩ නිදැලි ක්‍රමය	08
එළුවන්	11	කිරි ලබා ගැනීම සඳහා	පානන්	අඩ නිදැලි ක්‍රමය	01

b) පශු කර්මාන්තය සඳහා යෙදෙන ආහාර පිළිබද විස්තරය (ස්වාභාවික/කෘත්‍රිම/මිශ්‍ර)

සත්ව වර්ගය	ස්වභාවික	කෘත්‍රිම
කුකුළන් සඳහා	නිවුඩුහාල්,එළවළුකොටස්, කංකුං,ගැට කොළ, ජලය	විටමින්,කුකුල් කෑම
ගවයන් සඳහා	පුන්නක්කු,ජලය,තණකොළ	
එළුවන් සඳහා	පුන්නක්කු,කොස්කොළ,පිදුරු ජලය,එළවළු කොටස්	

මෙම සත්වයන් සඳහා ස්වභාවික හා කෘත්‍රිම මිශ්‍ර ආහාර වේලක් ලබා දෙනු ලැබේ.

c) පශු වෛද්‍යාමය සාධක (රෝග ආදිය) - *විශේෂිත රෝග වැළදී ඇතිබවට විස්තර නොමැත*

III. ධීවර කර්මාන්තය - *අදාළ නොවේ*

IV. ශක්ති ප්‍රභව

a) ප්‍රධාන ශක්ති ප්‍රභව වර්ගීකරණය

- පුනර්ජනනීය ශක්ති ප්‍රභව -
- පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව

පුනර්ජනනීය ශක්ති ප්‍රභවය	භාවිත කරන ප්‍රතිලාභීන් ගණන	පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව	භාවිත කරන ප්‍රතිලාභීන් ගණන
දර	728	පෙට්‍රල්	1800
සූර්ය පැනල්	15	ඩීසල්	778
බයෝ ගෑස්	-	එල්.පී. වායුව	1225
		භූමිතෙල්	25



මූලාශ්‍රය : 2023 දී පවුල් 800 ක් යොදා සිදුකළ සමීක්ෂණයක් ඇසුරිනි

b) ස්වභාවික ශක්ති සම්පත් කොරහි වන ඉල්ලුම හා සැපයුම් අනුපාත විශ්ලේෂණය

නිෂ්පාදන ක්‍රියාවලියට ස්වභාවධර්මයා විසින් ලබා දෙන සියළු දේ සම්පත් වලට අයත් වේ.ඇතැම් ස්වභාවික සම්පත් සැපයුමේ හිග කමක් ඇති අතර තවත් ඇතැම් ස්වභාවික සම්පත් සැපයුමේ හිග බවක් නැත.කාලයක් තිස්සේ පරිභෝජන සම්පත් සියල්ල පෘතුවියෙන් ලබා දෙනවා මෙන්ම අවශෝෂණය කරනු ලැබේ.අවුරුදු 60 කට පෙර සම්පත් වල ප්‍රමාණය හා වර්තමාණයේ සම්පත් ප්‍රමාණය අතර විශාල වෙනසක් පවතී.ක්‍රමයෙන් පෘතුවියෙන් ලැබෙන සම්පත් ප්‍රමාණය අඩුය.දියුණුවත් සමග මිනිසාගේ පරිභෝ ජනය වැඩි වු අතර සම්පත් භාවිතයද වැඩි විය. ප්‍රතිෂ්ඨාපනය කල හැකි සම්පත් ක්ෂය වීමකින් තොර වන නමුත් ප්‍රතිෂ්ඨාපනය කල නොහැකි සම්පත් නැවත ඇති වීමක් සිදු නොවන නිසාවෙන් අනාගත පරපුරට ඉතිරි වීමක් සිදු නොවේ.එය තිරසර සංවර්ධනයට බාධාවකි.

c) පුනර්ජනනීය ශක්ති ප්‍රභව යෙදවුම් සඳහා ප්‍රජාවේ දායකත්වය

- පුනර්ජනනීය බලශක්ති හඳුන්වා දෙමින් ඒවා ක්‍රියාත්මක කිරීම රාජ්‍ය මැදිහතත්වීම සහ සහනදායි ණය පහසුකම් මූලාධාර සැපයීම.
- ඉවතලන අපද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් බයෝ ගෑස් නිපදවීමට ජනතාව යොමු කිරීම.ඒ සඳහා වැඩසටහන් පැවැත්වීම.
- නිවෙස් වල හා ව්‍යාපාරික ස්ථාන වල සූර්ය පැනල භාවිතයට උනන්දු කිරීම.

5.සමාජ-සංස්කෘතික සන්දර්භය

I. පරිසර ගැටළු පිළිබඳ ප්‍රජාවේ අවබෝධය හා විසඳුම් යෝජනාකරණ යන්ත්‍රණය

තිරසර සංවර්ධනය කරා යන ගමන් මාර්ගයේ ආර්ථික සමාජ පමණක් නොව පරිසරයට හිමිවන්නේ ඉතා වැදගත් ස්ථානයකි.පරිසරය සැදුම් ලත් ජෛව විවිධත්වයට බලපාන මානව ක්‍රියාකාරකකම් නිසා පරිසරයේ සමතුලිතතාවය බිඳී විවිධ ගැටලු මතු වී ඇත.මිනිසා විසින් මෙසේ ගැටලු ඇති කරන්නා සේම ඊට හේතු සෙවිය යුත්තේ ද අප විසින්මය.

ජනගහණය ඉහල යාමත්,ගෝලීය උෂ්ණත්වය ඉහල යාමට සාපේක්ෂව මෙම සියලු ගැටලු නිර්මාණය වීමට මුල් වී ඇත.

මෙම ප්‍රදේශයේ හදුනාගත් පරිසර ගැටලු ලෙස,

කසල නිසි ලෙස බැහැර නොකිරීම
උදාඃ මවුන්ට් ක්ලිෆර්ඩ් රේන්ජ් හා මවුන්ට් ක්ලිෆර්ඩ් රෙසිඩන්සි නිවාස සංකීර්ණ දෙකෙහි කසල බැහැර කිරීම ගැටලු සහගත වීම.

- නොදිරන අප ද්‍රව්‍ය ඉවත් කිරීමට ප්‍රමාණවත් ක්‍රමවේදයක් නොමැති කමින් මාර්ග අසල දැමීම.
- නිවෙස් වල අපජලය කාණු පද්ධති මගින් මං මාවත් වලට මුදා හැරීම.
- රසායනික පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය

<u>විසඳුම්</u>

- ග්‍රාම සංවර්ධන සමිතිය හා එක්ව ප්‍රජා සහභාගිත්වයෙන් පරිසර කමිටුවක් පිහිටුවීම. .
- Clean sri lanka කමිටුව හා එක්ව ශ්‍රමදාන පැවැත්වීම. ඩෙංගු මර්ධන වැඩසටහන් පැවැත්වීම
- රසායනික පොහොර හා කෘමි නාශක භාවිතා කිරීම අවමය කිරීම සඳහා විකල්පයන් ලෙස පරිසර හිතකාමි ස්වභාවික පොහොර භාවිතය පිළිබද ගොවි සංවිධාන හා එක්ව ප්‍රජාව දැනුවත් කිරිම.
- කාලීන පාරසරික ගැටලු පිළිබද දැනුවත් කිරීම.
- පුනර්ජනනීය බලශක්ති භාවිතා කිරීම පිළිබද දැනුවත් කිරිම
- පරිසරය පිළිබද එය රැක ගැනීම පිළිබද යහපත් ආකල්ප ඇති කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

II. සම්ප්‍රදායික පරිසර දැණුම හා පරිචාර

i. ජනප්‍රවාද / ජනශෘතිය

කෝට්ටේ vi වන පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේදී උලකුඩය දේවියට යාග හෝම කිරීම සඳහා ඉන්දියාවේ සිට පැමිණි බ්‍රාහ්මණයින් පදිංචිව සිටි බ්‍රාහ්මණගම සිට යාග හෝම කිරීම සඳහා හෝමාගමට යන මාර් ගයේ පිහිටි සරුසාර භූමි ප්‍රදේශයක් දැක එම ප්‍රදේශයේ කැලෑ එළි කොට විවිධ වගාවන් සිදු කර ජනාවාස ඇති කර ගම්මානයක් බිහි කලහ.එය ව්‍යාප්තව පසුව මහා ගම්මානයක් බවට පත්වූ බවත් එම මහා ගම්මානය ව්‍යවහාරයේ පහසුවට මාගම්මන වූ බවත් ජනප්‍රවාදයේ දැක්වේ.තනි ග්‍රාම නිලධාරි වසමක් ලෙස පැවති මාගම්මන 1989 දී පරිපාලනයේ පහසුව සඳහා මාගම්මන නැගෙනහිර හා මාගම්මන බටහිර ලෙස ග්‍රාම නිලධාරි වසම් දෙකක් බවට පත් කරන ලදී.

b) දේශීය වෛද්‍ය ක්‍රම නොමැත

III. සම්ප්‍රදායික ජන කණ්ඩායම් හා පරිසර අභිවරණය නොමැත

IV. පරිසර ගැටළු සඳහා යෙදුණු විසදුම්/විකල්ප

ස්වභාවික හෝ කෘත්‍රිම දූෂකකාරක වාදුගෝලයට ජලගෝලයට හා ශිලාගෝලයට එකතුවීමෙන් සිදුවන ක්‍රියාවලි හේතුකොට ගෙන පරිසරයේ සමතුලිතතාවය බිදවැටීමේ සංසිද්ධිය නිසා පරිසර දූෂණය ඇති වේ.එහි ප්‍රතිඵලයක් ලෙස පරිසර ගැටලු නිරිමාණය වේ.

පාරසරික ගැටලු අතරින් ප්‍රධාන ගැටලුවකි වන කුණු කසල ගැටලුව , ඒ සඳහා අපට තනිව මුහුණ දිය නොහැකිය. ජනතාව ලෙස අප ආකල්පමය වෙනසක් ඇති කර ගත යුතුය.
එදිනෙදා නිවසේ එකතු වන දිරන කුණු කොම්පෝස්ට් බඳුනකට දැමිය හැකිය.
ඉවතලන ප්ලාස්ටික් බඳුන් වලින් නිවස අලංකරණය කර ගත හැකිය.
බලධාරීන් මෙන්ම මිනිසුන් යන දෙපාර්ශවයම වැඩි අවධානය යොමු කල යුතුය.
අපද්‍රව්‍ය කළමණාකරණයේ ධූරාවලිය එනම්,
වැලැක්වීම, අවම කිරීම,නැවත භාවිතය,ප්‍රතිචක්‍රීකරණය,ශක්ති උත්පාදනය හා බැහැර කිරීම යන සංකල්ප මත ක්‍රියාකිරීම මත ගැටලු යම්තාක් දුරට අවම කර ගත හැකිය.ඒ අනුව වඩාත් හානිදායි ස්ථායි අපද්‍රව්‍ය ප්‍රමාණයේ පරිමාව අඩු කර ගත හැකි ක්‍රියා මාර්ග නිෂ්පාදනය ,නැවත නිර්මාණය කිරීම , ජීවන රටාව සමාජමය රටාව වෙනස් කිරීම ද ඉහත ගැටලු අවම කරනු ලැබේ.
ප්ලාස්ටික් වෙනුවට විකල්පයක් ලෙස රෙදි මලු භාවිතය සිදු කල හැකිය.
කෘෂිකර්මාන්තයේ දී අවම විෂ සහිත පලිබෝධක තෝරා ගැනීම
හැකිතාක් පරිසර හිතකාමී ගොවිතැන් ක්‍රම හා වගා රටා අනුගමනය කිරීම.

V. කාලීන පාරිසරක අර්බුද හා අභියෝග
   a. වන විනාශය /කැළෑ එළිකිරීම -වාර්තා නොවේ.
   b. ජල හිඟය - වාර්තා නොවේ.
   c. පාංශු හායනය
   d. කැලි-කසල බැහැරකිරීම

මිනිසුන්ගේ පරිභෝජන රටාවේ සිදුවන කෘත්‍රිම වෙනස්කම් සහ අපද්‍රව්‍ය කළමනාකරණය නොමැතිකම මෙම බෙිදනීිය තත්වයට හේතු වේ.සමාජ ,ආර්ථික,පාරසරික හා සෞඛ්‍ය යන සියලුම අංශයන්ට මෙය ගැටලුවකි.අප පුරුදු වී සිටින්නේ නිවසේ එකතු වන කුණු නිවසින් එපිටට ගෙන යාමටයි.නිවෙස් වල අප ජලය පවා මාර්ගයට මුදා හැරේ.දිරාපත් නොවන ද්‍රව්‍ය වන ප්ලාස්ටික් හා කෘත්‍රිම ද්‍රව්‍ය ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ හා උපකරණ කසල ලෙස පරිසරයට මුදා හැරීම සිදු වේ.එදිනෙදා නිවෙස් වලින් 80% ක් පමණ පරිසරයට මුදා හරිනුයේ දිරාපත් වන ද්‍රව්‍යයි. මෙම ප්‍රදේශයේ තාවකාලික පදිංචිකරුවන් වැඩි වශයෙන් සිටීමත් කැලි කසල බැහැර කිරීම අවිධිමත් වීමට එක් හේතුවකි. වෙනත් රටක නම් මෙම කසල සම්පතකි. ප්‍රාදේශීය සභාව මගින් නොදිරන අපද්‍රව්‍ය එකතු කිරීම සිදු කල ද එය ප්‍රමාණවත් නොවේ. බොහෝ දෙනා පුරුදු වී සිටින්නේ කුණු රථය සඳහා කුණු ලබා දීමටයි.මෙහි ආකල්පමය වෙනසක් ඇති කල යුතුය.

e. දේශගුණික විපර්යාසවල බලපෑම

ස්වභාවික සංඝටක වල හෝ භූමි පරිභෝජනයේ හෝ මිනිසා විසින් ඇති කරනු ලබන දිගුකාලීන වෙනස්කම් නිසා මෙම වෙනස්කම් ඇති වී ඇති බව ගම්‍ය වේ. මෙම ප්‍රදේශයේ පසුගිය වසර 30 ක කාලය හා සංසන්ධනය කිරීමේ දී ,

- බෝග අස්වැන්නේ ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව අඩු වීමක් පෙනී යයි.
- සංචිත ආහාර අඩු වීම.
- රෝග පලිබෝධ ව්‍යාප්ත වීම
- ආක්‍රමණශීලී වල් පැළෑටි ඇති වීම
- සත්ව නිෂ්පාදන අඩු වීම
- බෝග වල ජීවිත කාලය කෙටි වීම ආදිය දැකිය හැකි සුවිශේෂී වෙනස්කම්ය.
- සාමාන්‍ය උෂ්ණත්වය ඉහළ යාම
- වර්ෂා රටාවේ වෙනස්කම් ඇති වීම

f. ආගන්තුක හා ආගන්තුක-ආක්‍රමණශීලී විශේෂවල බලපෑම

VI. පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපථ කරගැනීම (ඇමුණුම 02)

a. අභිමතාර්ථ අංක 06 - පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව

පරිසර තිරසාරත්වයට බලපාන අරමුණු 06 කි.මනුෂ්‍ය අවශ්‍යතා සපුරාලාමත් සම්පත් සුරක්ෂිතව භාවිතා කිරීමත් අතර සමතුලිතාවය පවත්වා ගැනිම සිදු කල යුතුයි.තමන් පරිභෝජනය කරමින් ඉදිරිපරපුරටත් රැකගනිමින් ජලය,ශක්තිය,දේශගුණය හා පරිසරය වගකීම් සහගත ලෙස භාවිතය මෙහි අරමුණයි.

මෙම මාගම්මන ප්‍රදේශයේ සුරක්ෂිත හා පහසුවෙන් ලබා ගත හැකිය. පිරිසිදු ජල උල්පත් ඇති අතර ජල පෝෂක ප්‍රදේශයක් ලෙස ද හදුන්වා දිය හැක. පානීය ජලය ලබා දෙන ප්‍රජා ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වනවා මෙන්ම ජලප්‍රවාහන මණ්ඩලයෙන් ද ළිං වැනි භූගත ජලය ද වැසි ජලය ද සුලබව ලැබේ.

විවෘතව මල අපද්‍රව්‍ය බැහැර කිරීම් නොමැති අතර සැමට පිරිසිදු හා වැසිකිලි පහසුකම් ඇත.වැසිකිලි නොමැති පවුල් වාර්තා වී නොමැත. ඒ අනුව මෙම ප්‍රදේශයේ සනීපාරක්ෂාව අතින් ද ගැටලු දැකිය නොහැකිය.

කෙසේ නමුදු තිරසාර සංවර්ධනයක් කරා යන ගමනේ ජලය සුරකීමට කටයුතු කල යුතුය.ඒ සඳහා 3R සංකල්පය යටතේ භාවිතා කල අපජලය කලමනාකරනය,වන වැස්ම ආරක්ෂා කිරීම,භූගත ජල නිධි ආරක්ෂා කිරීම,මතුපිට ජල ප්‍රභව දූෂණය නොකිරීම අපගේ යුතුකමකි.

b. අභිමතාර්ථ අංක 07 - ධරණීය හා සුනිත්‍ය බලශක්තිය

බලශක්තිය මිනිසාට අත්‍යවශ්‍යය වූවකි.එදිනෙදා ජීවත් වීමට ගමනාගමනයට ,සෞඛ්‍යය,අධ්‍යාපනය ආදි සියල්ලටම වැදගත් සේම ඒ හා සමානවම ඉන් පරිසරයට සිදු වන හානියද විශාලය.විශ්වාසනීය බව වියදම අඩු ,මිනිසාට ලගා කර ගැනීමට හැකි,නාස්තිය අවම කර ගත හැකි,උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි පරිදි නූතන බලශක්තිය අනාගත පරපුරටද සම්පත් ආරක්ෂා වන පරිදි අද දවසේ අවශ්‍යතා සපුරා ගැනීමට වග බලා ගත යුතුය.

මෙම ප්‍රදේශයේ 80% ක් ම හරිතාගාර වායු නිකුත් කරනුයේ වැඩි වශයෙන් පෙට්‍රල් ඩීසල් භාවිතය නිසාය.ෆොසිල ඉන්ධන පරිසරයට හානි කර වායුව නිකුත් කරන බැවින් සූර්ය පැනල ආදිය භාවිතයට යොමු කල යුතුය.මෙම ප්‍රදේශයේ සූර්ය පැනල භාවිතා කරනුයේ සුළු වශයෙනි.මෙම ප්‍රදේශයේ දර වැනි දෑ බහුලව භාවිතා කල ද ඉන් සිදුවන අනිසි පරිසර බලපෑම බොහෝමය. ශාක විනාශ වීම ගෝලීය උෂ්ණත්වය ඉහලයාම නිසා දර ලාභදායි වුවත් දහනයේ දී සිදු වන විෂ වායුව නිසා පරිසරයට පමණක් නොව ශ්වසන රෝග වැනි සෞඛ්‍ය ගැටලු ද ඇති වේ.

ඉලෙක්ට්‍රික් වාහන හදුන්වාදීම, ඒ සදහා රජයේ මැදිහත් විම.සහනදායි පොලි යටතේ ණය පහසුකම් සැලසීම, පුනර්ජනනීය ශක්ති ප්‍රභව භාවිතයට උනන්දු කර විම ආදිය සිදු කල හැකිය .

c. අභිමතාර්ථ අංක 12 - තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන්

තිරසර සංවර්ධනයේ වැදගත් ස්ථානයක් පරිභෝජනය හා නිෂ්පාදන රටාවන්ට හිමි වේ.මෙහිදී දේශීය ආහාර ප්‍රවර්ධනය හා පසු අස්වනු හානිය අවම කිරීමට පියවර ගත යුතුය.සාම්ප්‍රදායික අපේ දේශීය ආහාර තිරසරබව ප්‍රවර්ධනය කරයි.එය සෞඛ්‍යයේ සේම තිරසරභාවයේද සංකේතයකි.දේශීය වශයෙන් ලබා ගන්නා අමුද්‍රව්‍ය භාවිතා කරමින් වායුගෝලයට මුදාහරින හරිතාගාර වායු ප්‍රමාණය අඩු කරයි.මෙය ආර්ථිකය ශක්තිමත් කිරීමට සහ ආහාර සුරක්ෂිතතාවයට හේතු වන්නේය.එසේම සාම්ප්‍රදායික ආහාර පවුලේ හා ප්‍රජාවන් එකට එකතු කරයි.ඒ අනුව පෝෂණයෙන් එහා ගිය වැඩි යමක් ඉන් ලැබේ.

පරිභෝජන රටාව නිෂ්පාදන රටාව පරිසරයට අහිතකර නොවන අයුරින් හැඩ ගස්වා ගැනීම තුලින් අපේක්ෂා කරන අරමුණු කරා ළඟා විය හැක.

මෙහිදී දේශීය බීජ ආරක්ෂා කිරීම,පරිසර හිතකාමී පලිබෝධ පාලන ක්‍රම භාවිතය,පරිසරහිතකාමී ගොවිතැන් ක්‍රම හා වගා රටා භාවිතය සිදු කල හැකිය.

d. අභිමතාර්ථ අංක 13 - දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්

දේශගුණික විපර්යාස වර්තමානයේ වඩාත් අවධානයට ලක් වී ඇත්තේ එහි ඇති පාරසරික ප්‍රබලත්වය මතයි.මිහිතලයේ හෙට දවස තීරණය වන්නේ අද දවසේ මිනිස් ක්‍රියාකාරකම් මතයි.

කාර්මික විප්ලවයෙන් පසුව මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීමත් අධික ජනගහණය නිසාවෙන් ඉදිකිරීම් වැඩි වීමත්, ජල ප්‍රවාහ වසා දැමීම ඔ්විට ආශ්‍රිත ප්‍රදේශ වල නිවාස ඉදි කිරීම් ආදි කරුණු මෙම ප්‍රදේශයට සුවිශේෂී වේ.

අධික ලෙස රථ වාහන භාවිතය,විදුලිය නිපදවීමට ෆොසිල ඉන්ධන දහනය,දින දින වැඩි වෙන ජනගහණය කර්මාන්ත නිසා ගෝලීය උෂ්ණත්වයේ වෙනස් විම මෙම ප්‍රදේශ වලට ද දැනෙනු ඇත.

වර්ෂාපතන රටාවේ වෙනස් වෙනස් විම ලෙඩ රෝග අතීතයට සාපේක්ෂව සුලබව දැකිය හැකිය.මීට වසර 30 කට පමණ පෙර මෙම ප්‍රදේශයේ කුරුඳු. පොල් තේක්ක,රබර් වැනි භෝගයන්ගෙන් ගහණය වූ ජෛව පද්ධතියකින් අනූන වූවකි.තිරසර සංවර්ධනය අත්පත් කර ගැනීමට නම් ඉහත අහිතකර පරිසර බලපෑම් අවම කර ගත යුත්තේ අප විසින්ම ය.

e. අභිමතාර්ථ අංක 14 - සාගර සම්පත් සංරක්ෂණය හා පිරිමැසුම්දායක භාවිතාව - අදාල නොවේ.

f. අභිමතාර්ථ අංක 15 - භෞම පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසර භාවිතාව

පෘතුවියේ විශාලම පද්ධතිය භෞම පද්ධතියයි. වායු ගෝලීය පද්ධතිය ,ජල ගෝලීය පද්ධතිය,ශිලා ගෝලීය පද්ධතිය හා ජෛව ගෝලීය පද්ධතියෙන් සැදුම් ලත් භෞම පද්ධතිය ආරක්ෂා කිරීම ඉහත අභිමතාර්ථ ඉටු කර ගැනීමට හේතු වේ.මෙය මෙම ප්‍රදේශයට ද පොදු මූලධර්මයකි.භෞතික පරිසරය නිර්මාණය වී ඇත්තේ ඉහත පද්ධති අතර අන්තර් සම්බන්ධතාවයෙනි.අවියෝජනීය වූ මෙම සබඳතාවය බිඳ වැටීම හේතුවෙන් වැඩි අවධානයක් භෞම පරිසර සංරක්ෂණය පිළිබඳ යොමු කල යුතුය.

විශේෂයෙන් මෙම ප්‍රදේශයේ මානව සම්පත ප්‍රසාරණය වීම හේතු කොට ගෙන නිවාස සංකීර්ණය බිහි වීම,කෘෂිකාර්මික කටයුතු,කාර්මික කටයුතු වැනි ආර්ථික කටයුතු සිදු කිරීමේ දී ස්වභාවික සම්පත් ,ඛනිජ සම්පත් අසීමිත ලෙස භාවිතා කර ඇති බැවින් පරිසර සමතුලිතතාවය බිදී පාරසරික ගැටළු ස්වභාවික ක්‍රියා මෙන්ම වැඩි වශයෙන් මානව ක්‍රියා හේතුවෙන් නිර්මාණය වී ඇත.

ඒ අනුව මෙම ප්‍රදේශයේ ගෘහස්ථ පරිභෝජනය මගින් හා කුණු කසල මගින් අපවිත්‍ර වීම,කෘෂිකාර්මික හා කර්මාන්ත කටයුතු,නිවාස සංවර්ධන යෝජනා හා මාර්ග සංවර්ධන නිසා ශාක ප්‍රජාව විනාශ වීම,කෘෂිකාර්මික කටයුතු සඳහා රසායනික පොහොර හා කෘමි නාශක භාවිතය,දිරාපත් නොවන ප්ලාස්ටික් හා කෘත්‍රිම ද්‍රව්‍ය ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ හා උපකරණ පරිසරයට මුදා හැරීම,ප්‍රවාහනයේදී ෆොසිල ඉන්ධන භාවිතය වැඩි වීම,ඉඩම් කට්ටි කිරීම,ආදි වූ පාරසරික ගැටළු අවම කිරීම තුලින් ඒවා ආරක්ෂා කිරීම තුලින් ඉඩම් අවභාවිතය වැලැක්වීම පරිසර හිතකාමී ආකල්ප වර්ධනය හා

හා සරල දිවි පැවැත්ම පිළිබද සිතුම් පැතුම් හා චර්යාවන් සමාජ ගත කිරීම තුලින් හා ඉහත පවසන ලද ජෛව විවිධත්වයට හානි කිරීම නතර කිරීම තුලින් පාරසරික තිරසර බව අදටත් හෙටටත් සුරක්ෂිත වන බව නොඅනුමානය.

8.තිරසර පරිසර සංවර්ධනය හා පරිසර කළමනාකරණ යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා නව අදහස්,යෝජනා හා නිර්දේශ

- 3R සංකල්පය භාවිතා කර පරිසර කළමනාකරණ පද්ධතියක් ප්‍රජාව සඳහා හඳුන්වා දීම.
- ප්‍රජා සහභාගිත්වයෙන් පාරසරික වැඩසටහන් එනම් රුක් රෝපණ වැඩසටහන් ශ්‍රමදාන වැඩසටහන් ඩෙංගු මර්ධන වැඩසටහන් නිරන්තරයෙන් ක්‍රියාත්මක කිරීම
- කාලීන පාරසරික ගැටලු සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
- අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබද වසමේ සමිති සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම
- පෝස්ටර් දැන්වීම් ආදිය ප්‍රදර්ශනය
- කාර්මික දූෂණය පාලනය සඳහා සහනශීලී ණය පහසුකම් සැලසීම.
- පාරසරික කළමනාකරණ පද්ධති හඳුන්වා දීම
- නීති හා රෙගුලාසි ලෙස පාරසරික ආරක්ෂණ බලපත්‍ර ලබා දීම.
- ප්‍රමිතීන් පිළිබද කොන්දේසි පැනවීම හා නීතිමය ක්‍රියා මාර්ග ගැනීම බලාත්මක කිරීම.
- පරිසර හිතකාමී පලිබෝධ පාලන ක්‍රම භාවිතය,පරිසර හිතකාමී ගොවිතැන් ක්‍රම හා වගා රටා භාවිතය පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා පුහුණු වැඩහටහන් පැවැත්වීම
- දේශීය බීජ වර්ග සංරක්ෂණය කිරීම හා හුවමාරු කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.
- දේශීය සාම්ප්‍රදායික ආහාර වට්ටෝරු පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- බුලත්කනත්ත දෙනිය වෙල්යායේ වල් වැදී ඇති හෙක්ටයාර් 4 ක පමණ හැල් කුඹුරු කොටස වැවක් ලෙස නිර්මාණය කර එහි ජලජ පැලෑටි සහ මිරිදිය මත්ස්‍ය වගාව කිරීම තුලින් ජල මූලාශ්‍ර සංරක්ෂණය පාරසරික සංරක්ෂණය හා නව ජීවන වෘත්තීන් උත්පාදනය වේ.(මාගම්මන විකාශා ප්‍රජා ජල සමිතිය මගින් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත.)
- සංවර්ධනය වෙමින් පවතින දියගම වල්ගම මාර්ගය දෙපස මාගම්මන නැගෙනහිර කොටසේ රුක් රෝපණ වැඩසටහනක් කිරීම.
- GAP වැනි යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ගොවීන්ට හඳුන්වා දීම
- ලෝකයේ මේ වන විට භාවිතා වන හරිත ඵලදායිතාව(GP)පූර්ණ ගුණාත්මක කළමණාකරණය(TQM) සුපිරිසිදු නිෂ්පාදන(CP)ඵලදායිතා සංකල්ප භාවිතය(5 S) වැනි උපාය මාර්ග හඳුන්වා දීම.

VII. ඇමුණුම්

a. සිතියම්
b. රූප සටහන් /කටු සටහන්/චිත්‍ර
c. ප්‍රජා සහභාගීත්ව පර්යේෂණ/සමීක්ෂණ